FORB Learning Platform

# Script: Freedom of Religion or Belief: the right to have or change your religion or beliefs

# ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති නිදහසඃ ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීමට හෝ වෙනස් කිරීමට ඇති අයිතිය

ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීමට, තෝරා ගැනීමට, වෙනස් කිරීමට හෝ හැර යාමට ඇති නිදහස ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති නිදහසේ ප්‍රධානතම පැතිකඩක් වනවා. මෙය ඔබේ පුද්ගලික අවබෝධය සම්බන්ධ කාරණයක්. එබැවින් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිති අයිතිවාසිකමේ අභ්‍යන්තර පැතිකඩක් වශයෙන් මෙය හඳුන්වනවා. ඔබේ ආගම හෝ විශ්වාසය ඇති ව සිටීමට හෝ වෙනස් කිරීම්ට ඇති අයිතිය පරම අයිතිවාසිකමක්. ඒ කියන්නේ ජාත්‍යන්තර නීතියට අනුව මේ අයිති අයිතිවාසිකම් කිසිමදාක සීමා කළ නොහැකි යි. ඔබ ක්‍රිස්තියානි ආගමට, මුස්ලිම් ආගමට, හෝ බහායි ආගමට අයත් වුවත්, ඔබ අදේවවාදියෙක් වුවත්, ඔබ සිංගප්පූරුවේ ජීවත් වුවත් ස්වීඩනයේ හෝ සුඩානයේ ජීවත් වුවත්, ඔබ සිටින ප්‍රදේශයේ සාමය තිබුණත් යුද්ධයක් තිබුණත්, ආගමික නායකයින් හෝ දේශපාලන නායකයින් කුමක් පැවසුවත්, ඔබ සහ අනෙකුත් සියලුම පුද්ගලයින්ට තමන්ගේ විශ්වාස පවත්වාගෙන යාමට හෝ ඒවා වෙනස් කිරීමට හෝ විශ්වාස නොකරන්නෙක් වූ බවට පත්වීමට අයිතිවාසිකමක් තිබෙනවා.

ඇත්තෙන්ම බොහෝ දෙනෙකුට මේ පරම අයිතිවාසිකම් අහිමි වී යනවා විශේෂයෙන්ම ආණ්ඩු, පවුලේ සාමාජිකයින්, හෝ ඔවුන්ගේ ප්‍රජාවල සිටින කණ්ඩායම් විසින් ඔවුන්ගේ ආගම හෝ විශ්වාසය හේතුවෙන් ඔවුන්ට දඬුවම් කරන හෝ පහර දෙන අවස්ථා තිබෙනවා.

ඇතැම් ආණ්ඩු යම් යම් ආගම් හෝ විශ්වාස තහනම් කරනවා. ඊකමබ ටදබට කියන්නේ චීනයේ තහනමට ලක්වී ඇති බෞද්ධ විශ්වාසයක් සහ ව්‍යවහාරයක්. ඔවුන්ගේ එම විශ්වාස අතහැර දැමීම සඳහා බලයෙන් යොමුකර ගැනීමේ අරමුණිනින් සිදු කරනු ලබන සිරගත කිරීම්, වධහිංසා, බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම්, සහ නැවත අධ්‍යාපනය ලබාදීම් සඳහා මුහුණ දෙන්නට ඊකමබ ටදබට ප්‍රගුණ කරන පුද්ගලයින්ට සිදුවී තිබෙනවා.

එරිත්‍රියාවේ රජයෙන් පිළිගත් ආගම් තිබෙන්නේ හතරයි. රජයේ පිළිගැනීම්ට ලක් නොවූ ආගම් වන පෙන්තකොස්ත ක්‍රිස්තියානිවරුන් සහ යොහෝවාගේ සාක්ෂිකරුවන් වැනි ආගම් වලට අයත් වන පුද්ගලයින් විවිධ විවිධාකාරයෙන් කුරිරු දඬුවම් වලට ලක් වී තිබෙනවා.

ඔවුන්ගේ ආගමික විශ්වාස හා අනන්‍යතාවය හේතුවෙන් ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් වීම සඳහා පුද්ගලයින් ඉලක්ක බවට පත්වන වෛරී අපරාධ, ආගම ඇදහීමට හෝ විශ්වාස දැරීමට ඇති අයිතිය උල්ලංඝනය වීම සඳහා වඩාත් සියුම් උදාහරණයක් වශයෙන් ගන්නට පුළුවන්. මෙහිදී මේ පුද්ගලයින් පහර දෙන්නේ ඔවුන් යම්කිසි ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීම හේතුවෙන්.

2015 වර්ෂයේ දී ප්‍රංශයේ මුස්ලිම් බැතිමතුන්ට එරෙහිව සිදුවන අඩන්තේට්ටම්, හිංසන සහ සාපරාධී හානි ප්‍රමාණය 250% කින් වැඩි වූ අතර එවැනි සිදුවීම් 336ක් වාර්තා වී තිබෙනවා. ඒ වගේම යුදෙව් ප්‍රජාවට එරෙහිව සිදුවන වෛරී අපරාධ තවදුරටත් ඉහළ මට්ටමක පැවත ඇති අතර එවන් වෛරී අපරාධ 715 ක් වාර්තා වී තිබෙනවා.

ග්‍රාමීය මෙක්සිකෝවේ ඇතැම් ප්‍රදේශවල සාම්ප්‍රදායික සහ කතෝලික ක්‍රිස්තියානි ආගමිකභාවය රැක ගැනීමට බලාපොරොත්තු වන ප්‍රජා නායකයින් විසින් එම ප්‍රදේශවල වසන ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානියවරුන් හිංසනයට ලක් කිරීමට සහ ඔවුන් ඉඩම් වලින් පලවා හැරීමට කටයුතු කර තිබෙනවා.

බොහෝ රටවල්වල ආගමික අනන්‍යතාවය, ජාතික අනන්‍යතාවය සහ රාජ්‍යයේ අනන්‍යතාවය එකිනෙක් සමීපව බැඳී පවතී. එවන් වාතාවරණයක් යටතේ ආගමික සුළුතරයන් සහ අදේවවාදීන් ඇතුළුව බහුතර ආගම අතහැර යන්නන් ජාතියට ද්‍රෝහි වූවන් වශයෙන්, එසේත් නැතිනම් ජාතික ආරක්ෂාවට තර්ජනයක් වශයෙන් පවා සලකනු ලැබීමට ඉඩ තිබෙනවා.

ආගමක් හැර යාම සඳහා ඇති පරම අයිතිය අයිතිවාසිකම් බොහෝ අවස්ථාවල නොසලකා හරිනු ලබනවා.

ඉන්දුනීසියාවේ ආගමික නිදහස සම්බන්ධයෙන් නීති තිබෙනවා. එනමුත් මේ නීති හරහා ආරක්ෂා කෙරෙන්නේ ඉස්ලාම්, කතෝලික හා ක්‍රිස්තියානි, බෞද්ධ කන්ෆියුෂියන්වාදී සහ හින්දු යන ආගම් පමණයි. අදේවවාදය එතුළින් ආරක්ෂා වී නැහැ. මුස්ලිම් පසුබිමකින් එන තිස් හැවිරිදි පුද්ගලයෙකු වන ඇලෙක්ස් ආන් දෙවියන් කියා කෙනෙක් නැත යනුවෙන් ෆේස්බුක් හි අදේවවාදී පිටුවක් ආරම්භ කිරීම හේතුවෙන් අවුරුදු දෙකහමාරක සිර දඬුවම දඬුවමකට සහ ඩොලර් 11,000 ක දඩයකට මුහුණදීමට සිදුවුනා.

අන්තර්ජාලය හරහා ආගමට අවමන් කරන පණිවිඩයක් පැතිරවීමෙන් සහ අනෙකුත් පුද්ගලයින්ට ද අදේවවාදය වැළඳගන්නා මෙන් ආරාධනා කිරීමෙන් ආන් විසින් ආගමික වෛරය හෝ එදිරිවාදය පැතිරවීම අරමුණු කරගත් තොරතුරු බෙදාහරින ලද්දේ යැයි ඔහුට එරෙහිව චෝදනා කරනු ලැබුවා. කෝපයට පත් වූ කලහකාරී පිරිස් ආන්ට පහර දුන්නා. ඔහු තමන්ගේ ෆේස්බුක් පිටුවේ ප්‍රසිද්ධියේ සමාව ඉල්ලා සිටින පණිවිඩයක් පළ කර තිබුණ ද ඔහුගේ ප්‍රජාවෙන් ඔහුව ප්‍රතික්ෂේප කරනු ලැබුවා.

ඉරානයේ ඉස්ලාම් ආගමේ සිට ක්‍රිස්තියානි ආගමට මාරු වූ තැනැත්තන්ට, විශේෂයෙන්ම නිවෙස්වල පවත්වාගෙන යන ලියාපදිංචි නොවූ පල්ලිවලට සම්බන්ධ වූවන්ට දැඩි දඬුවම් පමුණුවනවා. 2017 ජූලි මාසයේදී එසේ ආගම මාරු කළ හතර දෙනෙකුට එරෙහිව ජාතික ආරක්ෂාවට පටහැනි ලෙස කටයුතු කිරීමේ චෝදනා එල්ල කර දස වසරක් දක්වා සිර සිරදඬුවම් නියම කළා. මීට පෙර අවස්ථාවකදී ඔවුන් අතරින් තිදෙනකු සත්ප්‍රසාද වයින් පානය කිරීම හේතුවෙන්වෙන් කසපහර අසූවක් ලැබීමට නියම කරනු ලැබ තිබුණා. රජය තවදුරටත් ඔවුන් මුස්ලිම් ආගමිකයින් වශයෙන් සලකන බැවින් සහ ඉරානයේ මුස්ලිම්වරුන්ට ඇල්කොහොල් පානය තහනම් බැවින් එලෙස දඬුවම් පමුණවා තිබුණා.

බහුතර ආගම හැර යාම සම්බන්ධයෙන් හෝ යම් යම් කණ්ඩායම්වලට අයත් වීම සම්බන්ධයෙන් පුද්ගලයින්ට එරෙහිව පනවන තහනම් සහ දඬුවම් සාධාරණීකරණය කිරීම සඳහා දේශපාලන සහ ආගමික නායකයින් බොහෝ විට යොදා ගන්නේ පූජනීය ග්‍රන්ථවල හෝ ආගමික නීති සම්ප්‍රදායන්හි ඔවුන් විසින්ම සිදුකරන ලද අර්ථ නිරූපණයි. එසේ පනවන දඬුවම් අතරට මරණීය දණ්ඩනය, සිරගත කිරීම්, රැකියාව අහිමි කිරීම්, හෝ විවාහය අවලංගු කිරීම් හා ළමයාගේ භාරකාරත්වය අහිමි කිරීම ඇතුළත් වෙනවා. සෞදි අරාබිය සහ පකිස්ථානය ඇතුළු බොහෝ මුස්ලිම් රටවල ඉස්ලාම් ආගම හැර යාම සම්බන්ධයෙන් ඇති අයිතිය මත එවැනි නීතිමය සීමා කිරීම් පනවා තිබෙනවා. නමුත් එය අනිවාර්යයෙන් සිදුවන්නක් නොවේ. උදාහරණයක් වශයෙන් සියෙරා ලියෝනයේ 70% ක් පමණ මුස්ලිම් ජනතාව වාසය කරන අතර 20%ක් පමණ ක්‍රිස්තියානි ජනතාව වාසය කරනවා. එරට ජනතාව ප්‍රසිද්ධියේ ආගම අදහන අතර එය දේශපාලනීකරණය වී නැහැ. ආගම් දෙක අතර පුද්ගලයින් මාරුවීම් සාමාන්‍ය දෙයක්.

මෙවැනි ප්‍රශ්න මුස්ලිම් බහුතරයක් සහිත රටවලට පමණක් සීමා වෙන්නේ නැහැ. මධ්‍යම අප්‍රිකානු ජනරජයේ ඇතැම් ප්‍රදේශ ප්‍රදේශවල රාජ්‍ය විරෝධී සටන්කාමීන් මුස්ලිම් සුළුතර කණ්ඩායම්වලට ක්‍රිස්තියානි ආගමට මාරුවීමට බලකිරීම සඳහා මරණ තර්ජන යොදාගෙන තිබෙනවා. ඉන්දියාවේ

ප්‍රාන්ත කිහිපයකම පුද්ගලයින්ට ආගම මාරු කිරීම් සම්බන්ධයෙන් සීමා පනවන නීති සම්මත කර තිබෙනවා. උදාහරණ වශයෙන් පුද්ගලයකුට ආගම මාරු කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා රාජයේ ආයතනවල අවසර ලබාගත යුතු වෙනවා.

ඒ වගේම මේ අයිතිවාසිකම උල්ලංඝනය කරන එකම පාර්ශ්වය රජය නොවේ. ප්‍රචණ්ඩත්ව තර්ජන යටතේ ආගම මාරු කරන අවස්ථා ඇතුළුව ක්‍රිස්තියානි සහ මුස්ලිම් ප්‍රජාවන් ට හින්දු ජාතිකවාදී කණ්ඩායම් විසින් බරපතළ ලෙස ප්‍රචණ්ඩ ප්‍රහාර එල්ල කළ අවස්ථාවන් ද ඉන්දියාවේ ඇති වී තිබෙනවා. ඇතැම් අවස්ථාවල ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින්ට ආපසු තම නිවහන බලා යාමට අවසර ලබා දෙන්නේ ඔවුන් ආගම මාරු කළ විට පමණක් යැයි නියම කළ අවස්ථා ද තිබෙනවා.

මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන්නේ ආගමික භක්තිකයින් පමණක් නෙවෙයි.  ආගමික අදහස් විවේචනය කරන හෝ ආගම් සහ රාජ්‍යය අතර සම්බන්ධතාවය විවේචනය කරන අය බරපතළ අවදානමකට මුහුණ දෙනවා. මෑතකදී ආගමික අදහස් සහ ව්‍යවහාර විවේචනයට ලක් කළ බංග්ලාදේශයේ බ්ලොග් රචකයින් කිහිපදෙනෙක්ම එරට අන්තවාදී කණ්ඩායම් විසින් මරා දමනු ලැබුවා. මෙම ප්‍රචණ්ඩ අන්තවාදී කණ්ඩායම් නැවැත්වීමට බංග්ලාදේශ රජය ගත් වෑයම් කණගාටුදායක ලෙස තවමත් සාර්ථක වී නැහැ. ඇතැම් ආණ්ඩු ආගමික අදහස් විවේචනය කරන පුද්ගලයින් මත සිදුකෙරෙන ප්‍රහාර හෙළා දකින්නේ නැහැ. එසේ නිහඬව සිටීමෙන් ප්‍රචණ්ඩත්වය සාධාරණ බව සහ පිළිගතහැකි බවට පණිවිඩයක් යැවෙනවා.

ආගම හෝ විශ්වාස මාරු කිරීමේ නිදහස ජාත්‍යන්තර මට්ටමේ ඉතාමත් විවාදයට තුඩු දුන් කාරණාවක්.  ඇත්ත වශයෙන්ම එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් අලුතින් සම්මුතියක් හෝ ප්‍රකාශයක් සඳහා එකඟ වන සෑම අවස්ථාවකදී ම ආගම මාරු කිරීම සඳහා වන අයිතිය ප්‍රකාශ වී ඇත්තේ වඩ වඩාත් දුර්වල ලෙසයි.

එසේ ප්‍රකාශ වන භාෂාව වඩ වඩාත් දුර්වල වී ඇතත්,  සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අර්ථ නිරූපණය කළ යුත්තේ කෙසේදැයි රටවල් වලට උපදෙස් දීමේ වගකීම භාර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව ප්‍රකාශ කර තිබෙන අන්දමට ආගමක් ඇතිව සිටීමට හෝ පිළිගැනීමට ඇති අයිතියට තමන් දැනට අදහන ආගම හෝ විශ්වාසය වෙනුවට වෙනත් ආගමක් හෝ විශ්වාසයක් ඇදහීම හෝ අදේවවාදී අදහස් පිළිගැනීමට, තමන්ගේ ආගම හෝ විශ්වාසය වෙනස් නොකර පවත්වා පවත්වාගෙන යාමට ඇති නිදහස ද ඇතුළුව ආගමක් හෝ විශ්වාසයක් තෝරා ගැනීමේ නිදහස ඇතුළත් වනවා.

සාරාංශයක් ලෙස කියනවානම්, ඔබේ ආගම හෝ විශ්වාසය පවත්වාගෙන යාමට හෝ වෙනස් කිරීමට ඇති අයිතිය  පරම අයිතියික්.  එය කිසිම වාතාවරණයක් යටතේ සීමා කළ නොහැකියි. කෙසේනමුත් ඇතැම් ආණ්ඩු මේ අයිතිය සීමා කරන අතර තමන්ගේ ආගම  හෝ විශ්වාසය පවත්වාගෙන යාම හෝ වෙනස් කිරීම් වෙනුවෙන් සමාජයේ ඇතැම් පවුල් හෝ කණ්ඩායම් විසින් පුද්ගලයන් වෙත විවිධාකාරයෙන් දඬුවම් පමුණුවනවා.

මානව හිමිකම් ලේඛන ද ඇතුළුව, ආගමක් හෝ විශ්වාසයක් ඇතිව සිටීම හෝ වෙනස් කිරීම සඳහා වන අයිතිය සම්බන්ධයෙන් වැඩි විස්තර, වෙබ් අඩවියේ ඇති පුහුණු මෙවලම් වලින් ඔබට සොයාගත හැකි වේවි.

Copyright: SMC 2018